# <u>'පට්ඨාන' දහවෙනි දේශනාව</u>

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට අනත්න කරුණාවකින් සියලුම සත්වයන් කෙරෙහි දයාව උපදවල පාරමී ධර්මයන් සම්පාදනය කොටගෙන චිරාත් කාලයක් සංසාරයට බැඳ තබා තියෙන්නාවූ ලෝභය සමුදය සත්‍ය වශයෙන් අවබෝධ කරලා තුරන් කරගෙන දුක්ඛ සත්‍ය අවබෝධ කරගෙන නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කරගෙන මාර්ගය වැඩීමෙන් චතුරාර්ය සත්‍ය ධර්මයන් පරිපූර්ණව අවබෝධ කොටගෙන ලෝකයාට එය නිර්මලව දේශනා කරමින් සත්වන්ට පිහිට උනාවූ අනන්ත ගුණ ඇති සම්මා සම්බුදුරජාණන්වහන්සේට අනන්ත සීල ඇති අනන්ත සමාධි ඇති අනන්ත ප්‍රඥාවෙන් සන්තානය බැබලෙන්නාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනව මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සන්තානයේ පහළ වුනාවූද උන්වහන්සේගේ ඒ උතුම් බුද්ධ ඥානයට දැනී පෙනී ගියාවූද අවබෝධ කොට ගත්තාවූද අනන්ත අපරිමාණ ගුණ ඇති ශ්‍රී සද්ධර්මස්කන්ධයට මම නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන් කොට නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂව අවබෝධ කොට ගත්තාවූ ආහුණෙය්‍යා ආදී ගුණයන්ගෙන් සමන්විත පරිපූර්ණ වූ ජීවිත ඇති ශාන්තිනායක සම්මා සම්බුදු රජාණන්වහන්ස්ගේ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධර්ම රත්නයට සංඝ රත්නයට වන්දනා මාන කිරීමෙන් සහ වන්දනා කිරිමේ කුසල චේතනා මතුකර ගැනීමෙන් පහළ වන්නාවූ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන්ද බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත අපරිමාණ ගුණානුභාව බලයෙන්ද මේ පිංවත් සැම දෙනා මේ ජීවිතයේදී දියුණුකර ගත්තාවූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන්ද අදත් අපි මේ කථා කරන්නාවූ ධර්ම කාණ්ඩය හැම දෙනාටම පහසුවෙන් තේරුම් ගන්ට වටහා ගන්ට ශක්තිය ලැබේවා! ඒ සඳහා කිසිම මාර බාධක ධර්මයක් ඉදිරිපත් නොවේවා!

සියලුම අකුසල ධර්මයන් යටපත් කරගෙන නීවරණ ධර්මයන්ගෙන් පීඩා විඳින්නේ නැතුව හිත එකලාසයක් කරගෙන සමාධි ගුණයේ පිහිටා සැම දෙනාටම මේ කියල දෙන ධර්ම කරුණුටික ඉතාමත්ම හොඳින් වටහා ගන්ට තේරුම් ගන්ට ඒවගේම ඊට අනුකූලව මනසිකාරය පවත්වල මාර්ගය වඩාගෙන නිවනින් සැනසෙන්ට ලැබේවා කියල අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. ආශීර්වාද කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අපි අද මේ පින්වත් සැම දෙනාටම තවත් ධර්ම කණ්ඩයක් කියල දෙනවා.

සූවිසි පට්ඨානය අපි පළමුකොටම ඉගෙන ගත යුතුයි. සූවිසි පට්ඨානයේ කියවෙන්නේ - ප්‍රත්‍යය ධර්ම හැටියට ඉදිරිපත්වන - උපකාරක ධර්ම හැටියට තවත් දෙයක් හටගැනීමට උදව් වෙන - පිහිට වෙන - උපකාරවන රුකුල් දෙන්නාවූ ධර්ම වලට ප්‍රත්‍යය ධර්ම කියල කියනවා. ඒ ප්‍රත්‍යය ධර්ම තිබෙනවා 24 ක්. ඒ ප්‍රත්‍යය ධර්ම පන්ති ගත කරලා තියෙනවා කොටස් 24 කට. ඒ ප්‍රත්‍යය ධර්ම සමූහය (24) අපි සැමදෙනාටම පාඩම් තියාගන්න පුළුවන් නම් හරි වටිනවා. ඒ ප්‍රත්‍යය ධර්ම 24 මේ විදයට අපි සජ්ඣායනා කරනවා.

**හෙතුපච්චයො, ආරම්මණපච්චයො, අධිපතිපච්චයො, අනන්තරපච්චයො, සමනන්තරපච්චයො, සහජාතපච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයො, නිස්සයපච්චයො, උපනිස්සයපච්චයො, පුරෙජාතපච්චයො, පච්ඡාජාතපච්චයො, ආසෙවනපච්චයො, කම්මපච්චයො, විපාකපච්චයො, ආහාරපච්චයො, ඉන්ද්‍රියපච්චයො, ඣානපච්චයො, මග්ගපච්චයො, සම්පයුත්තපච්චයො, විප්පයුත්තපච්චයො, අත්ථිපච්චයො, නත්ථිපච්චයො, විගතපච්චයො, අවිගතපච්චයො** කියල 24 ක් තියෙනවා.

මේ 24 ම ප්‍රත්‍යය ධර්ම 24 හැටියට කථා කරන්නෙ තවත් දේකට උපකාර වෙන නිසා. ඒ නිසා තවත් ධර්මවල හටගැනීමට - හටගත්ත ධර්මයක් පැවතීමට - ඉදිරියට පැවතීමට පිහිට වන්නාවූ උපකාරවන දේ 'ප්‍රත්‍යය ධර්ම' හැටියට කියනවා. දැන් එකම ධර්මයක්වත් තවත් ධර්මයකට උපකාර වන්නේ - පිහිට වෙන්නේ - රුකුල් දෙන්නේ එකම විදියට නෙමෙයි. ආකාර දෙක තුනක් තියෙනවා. ආකාර දෙක තුනකින් තවත් දෙයකට උපකාරවෙනවා. ඒ නිසා මේ ධර්ම විග්‍රහයේදී ප්‍රකටව ඉදිරිපත්වන ආකාර කීපයම වෙන වෙනමත් කියනවා. තනි තනිවත් කියනවා. ඒවා එක්කාසු කරලත් කථා කරනවා. අපිට ඒක ඉදිරියේදී දැන ගන්න පුළුවන්.

එතකොට ප්‍රත්‍යය ධර්ම කතාවේදී මේ සූවිසි පට්ඨානයේ ප්‍රත්‍යය ධර්ම වල අද අපි අරගන්නවා තුන්වෙනි උපකාරක ධර්මය හැටියට කථා කරන 'අධිපති ප්‍රත්‍යය' කියන එක. අපි මේ විදියට කියාගෙන ගිහිල්ලා ඉදිරියේදී නැවත ආපහු ඇවිල්ල හැරිලා බලලා අපි තේරුම් ගනිමු මේ ප්‍රත්‍යය ධර්ම වල සවභාවය. දැන් අද අපි කථා කරමු 'අධිපති ප්‍රත්‍යය ' නැත්නම් 'අධිපතිපච්චය' කියන තුන් වෙනි ප්‍රත්‍යය ධර්ම විග්‍රහය. ඒකෙන් කියන ටික මේ විදියට තේරුම් ගන්න එක හොඳයි.

කවදාක්වත්ම ධර්මයක් තනියෙන් පහළ වෙන්නේ නෑ. දැන් අපි සමාජය එක්ක ජීවත් වෙනකොට මනුස්සයෙකුට තනියෙන් ජීවත් වෙන්න බැනේ. ටික කාලයකට පැයකට හමාරකට දවසකට සතියකට මාසයකට තනියෙන් ජීවත් වෙන්න ගියත් එයාගේ ජීවිතේට ආහාරපාන ඇඳුම් පැළඳුම් යාන වාහන වශයෙන් ගන්න දේවල් අනිත් එක්කෙනාගේ උපකාරයක් ඇතුව තමයි ගන්න වෙන්නේ. එතකොට කෙනෙකුට තනියෙන් ජීවත් වෙන්ට බෑ. වනාන්තරේ ගහක් තනියෙන් පිහිටා තියෙන්නෙත් නෑ. එතකොට වනාන්තරයක් වෙන්නෙත් නෑ. ගහක් හැදෙන්ට අනිත් ගහක රුකුලක් උපකාරයක් හෙවනක් ප්‍රත්‍යයක් අවශ්‍ය යයි . මනුෂ්‍ය ජීවිතියකටත් ඒවගේ තවත් අයගේ උදව්ව උපකාරය සහ සම්බන්ධතාවය සහයෝගය අවශ්‍ය යයි. ඒවගේ මේ තිබෙන්නාවූ ධර්ම තනියෙන් පවතින්ට බෑ. හේතු ප්‍රත්‍යය නැතහොත් එකින් එකට උදව්වෙලා උපකාර වෙලා පවතින ධර්ම තනියෙන් පවතින්නේ නෑ. තමන්ගේ ක්‍රියාව තනියෙන් සිද්ධ කලත් තවත් එකක ලඟ පිහිටක් ඇතුව තමයි තියෙන්නේ. එහෙම තමයි ඒ ධර්ම වල හැටි. වෙනත් එහක උපකාරයක් මොකක් හරි දෙයක් එහෙම නැත්නම් තවත් එහෙකට උදව්වක් වෙන ගතියක් තියෙනවා.

දැන් අපි කථාකරන්නේ මේ දවස්වල හේතු ඵල ධර්මයන්ගේ කියවෙන චිත්ත - චෛතසික ධර්ම - රූප ධර්ම සහ නිර්වාණ ධාතුව කියන ඔය පරමාර්ථ ධර්ම ගැන. මේ පරමාර්ථ ධර්මවල පුද්ගලයෝ නෑ. පරමාර්ථ ධර්ම වල ආත්මයක් කෙනෙක් ජීවයක් පුද්ගලයෙක් නෑ. ඒවා ධර්මසවභාව. ඒ ධර්ම - පොකුරු ධර්ම හැටියට පවතිනවා. දැන් අපි මෙහෙමත් හිතල බැලුවොත් එහෙම විදුලිය කියන එක තියෙනවනේ. මේ විදුලිය අපිට ලබා ගැනීමට තනියෙන් ගන්න බෑ. සම්පූර්ණ අපි විදුලිය පාවිච්චි කරනවා කියල කිව්වට විදුලිය පාවිච්චි කරන්නෙ තව උපකාරක ධර්ම එකතු කරලා. විදුලිය නිෂ්පාදනය කරන තැනක් තියෙන්ට ඕන. විදුලිය තනියෙන් අහසෙන් ගේන්න බෑ. ඒක නිසා ඒක ගේන්න වයර් තියෙන්න ඕන. ඊළඟට වයර් අදින කණු තියෙන්න ඕන. පොළවේ නොගෑවෙන්න ඕන. ඊට පස්ස වයර් හරහා ගස් කොළන් ගෑවිලා නොතිබෙන්ට ඕනෑ. නිදහස් wireline එකක් තියෙන්න ඕන. ඊළගට ඒක පාරටම නිෂ්පාදන කරලා ගන්න බෑ. අපිට

පාවිච්චියට ඒවා තැන් තැන් වලින් කඩල කඩලා, ඒවා නැවත බෙදීම් කරලා තමයි සාමාන්‍යයෙන් අපේ ගෙදරක අපි මේ විදුලි bulb එකෙකින් ආලෝකය ගන්න තැනට එනකොට එන්නේ. දැන් අපි ඒ විදුලිය එහෙම ගත්තට අපි ගෙදරට ඇවිල්ල විදුලිය පාවිච්චි කරන්නේ අපේ ඇඟේ ගැවෙන්නේ නැති විදියට. ආරක්ෂා ඇතිව. ඒ එක්කම අපි විදුලිය පාවිච්චි කරන්නේ තවත් ක්‍රමයකට. ආලෝකයක් හැටියට - රස්නයක් හැටියට - සීතලක් හැටියට - ඔය විදියටනෙ. දැන් මේකේ පරමාර්ථය - මේ විදුලිය තනි ධර්මයක් උනාට ඒකට තනියම කෙලින්ම ඇවිල්ල අපිට උදව් කරන්න බෑ. ඒක තැන් තැන් වලින් පරිවර්තනය වෙලා - වෙනස් වෙනස් රූප හැදිලා - වෙනස් වෙනස් ආකාරයේ උදව් උපකාර තවත් ඒවගෙන් ලබාගෙන තමයි අපේ ගෙදරට ඇවිල්ල මේ විදුලිය අපි අත් විඳින කොට තියෙන්නේ - මේ වෙලාවේදී අපි ආලෝකයක් හැටියටයි විදුලිය ගන්නේ. එහෙම තමයි ඒකෙ හැටි.

ඒවගේම මේ පොකුරු ධර්මවල ඒ කියන්නේ පොකුරු කියන වචනේ මම පාවිච්චි කරන්නේ හිතක් පහළවෙන කොට ඒ හිතේ චෛතසික ධර්ම එක්කාසුවක් - චෛතසික ධර්ම පන්තියක් - චෛතසික ධර්ම ගොනුවක් තියෙනවා. ඒක ඉතින් එක එක සිත්වල හැටියට අඩුවෙනවා වැඩිවෙනවා. කුසල සිත්වල චෛතසික වැඩියි කියල අපි කිව්වනේ. අකුසල් සිත්වල චෛතසික ධර්ම අඩුයි. කුසල සිත්වල චෛතසික ධර්ම වැඩියි. අඩුවෙන් හෝ වැඩියෙන් ගත්තම මේවාගේ තිබෙනවා යම් කිසි ශක්ති සමූහයක් - ධර්මතා සමූහයක් - ඔය එක්කාසු වෙලා එක පොකුරට ක්‍රියාත්මක වෙන්නේ. එහෙම ක්‍රියාත්මක වෙන ධර්ම ගොඩේ සිද්ධ වෙන දෙයක් තමයි අද අපි කථා කරන්නේ. අධිපති ප්‍රත්‍යය කියල කියනවා. අධිපති කියල කියන වචනයත් අපි කල් ඇතුවම තේරුම් ගන්න එක හොඳයි. එතකොට මේක වටහා ගන්න ලේසියි.

<u>අධිපති ප්‍රත්‍යය</u> - අධිපති කියල කියන්නේ බලවත් කියන එක. එහෙම නැත්නම් යම්කිසි තැනක යම්කිසි දේක නායකයා - අධිපතියා. දැන් අධිපති කියල කියනකොට තියෙනවා අනිත් ඒවා අධිපතියට යටයිනේ. යම්කිසි ධර්මයක් අධිපතියි නම් - ප්‍රධානයි නම් - එයාගේ බලය වැඩියි නම් අනිත් ඒවා ඒකට යටයි. ඒකෙන් කියන්නේ නෑ ඒ අධිපති ධර්ම අනිත් ඒක්කෙනාට පීඩා කරනවා - තලාපෙලා හිංසා කරනවා පෙළනවා කියන එක නෙමෙයි ඒකෙන් කියන්නේ. අධිපති කියල කියන්නේ ධර්මතා දහයක් ගත්තොත් - අපි හිතමු මිනිස්සු දහ දෙනෙක් ගත්තොත් එක්කෙනෙක් අධිපති කියල කියන්නේ ඒ අනිත් නම දෙනාම ඒ අධිපතිත්වයෙන් සැලකෙන්නාවූ කෙනාට අවනත වෙන්ට ඕන - අනුයාත වෙන්ට ඕන - කීකරු වෙන්ට ඕන. ඒ අධිපතීත්වයෙන් සලකන කෙනා

කියන දේ - හිතන දේ - එයාට ඕනෑ කරන දේ අනිත් නමදෙනාගෙන් ඉෂ්ට වෙන්න ඕනේ. නම දෙනා ඒ අනිත් එක්කෙනාට අනුකූල වෙලා කටයුතු කරන්ට ඕනෑ. ඒක තමයි අධිපති සවභාවය. අනිත් අයට යන්න බෑ. අනිත් නම දෙනාට තනියෙන් යන්න බෑ. යන්ට බැරි ගතියක් අනිත් එක්කෙනාගේ තියෙනවා. අධිපතිත්වය දරන්නාවූ කෙනාට තියෙනවා අනිත් නම දෙනා තමන් අතහැරලා යන්නේ නැති තත්වයට පවත්වාගෙන යන්ට පුළුවන් බල විශේෂයක් - ගුණ විශේෂයක් - ධර්ම විශේෂයක් එයා තුල තියෙනවා. ඒකට තමයි අධිපති කියල කියන්නේ.

ප්‍රත්‍යය කියල කියන්නේ අපි උපකාරක ධර්මය කියල කිව්වා - එතකොට අධිපති සවභාවය දරාගෙන - බලවත් සවභාවය දරාගෙන තවත් එහෙකට උදව් වෙන උපකාර වෙන ධර්මයක් 'අධිපති ප්‍රත්‍යය'. දැන් ඕක ඔයවිදියට තේරුම් ගන්ට.

අපි මේ වෙලාවේ හිතන කොට - අපි මේ වෙලාවේ යමක් අදහස් කරන කොට - හිතන කොට - කථා කරන කොට - ක්‍රියා කරන කොට එතන වැඩ කරනවා ධර්ම පොකුරක්. ඒ ඒ ක්‍රියාවට ආරම්භක හැටියට ඉස්සරහට එන්නාවූ හිත ඒවගේම ඒ හිත සමග ක්‍රියාත්මක වෙන චෛතසික ධර්ම ගොනුව - ඔය ධර්මතා ටිකක් වැඩ කරනකොට එතැන තිබෙනවා අපිට අඳුනාගත යුතු චෛතසික 52 නුයි හිතෙනුයි අපිට දැන ගතයුතු ටිකක් තිබෙනවා. ඒ තමයි - මේවගේ තිබෙනවා අධිපති කම, බලවත් කම - අනිත් කෙනෙකුට බලයක් බලපෑමක් කරන්ට පුළුවන් - අනිත් අය තමාට නතු කරගැනීමට හැකියාව තිබෙන ධර්ම තිබෙනවා. ආන්න එහෙම ධර්ම 4 ක් අපි ඉගෙන ගත යුතුයි අධිපති ප්‍රත්‍යය යටතේ. තවත් කෙටියෙන් කාරණයක් කියල දෙන්නම්. ඒක මීට ඉස්සෙල්ල කියපු නිසා කියන්නේ නැතුව ඉන්ට හිතුවා.

දැන් මේ අධිපති ප්‍රත්‍යය ගැන කියන කොට මේක විග්‍රහ කරනවා විධි දෙකකට. ඒ තමයි එකක් 'ආරම්මණ අධිපති' - අරමුණක තිබෙන්නාවූ අධිපති කම - බලවත් කම - ප්‍රධානත්වය. ඔය එකක්. අනිත් එක තමයි 'සහජාත අධිපති' කියන්නේ. 'ආරම්මණ අධිපති - සහජාත අධිපති'. දැන් මම අලුත් වචනයක් පාවිච්චි කරපු නිසා එතන මේ අහගෙන ඉන්න අයට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. සහජාත කියල වචනයක් පාවිච්චි කරා. සහජාත කියල කියන්නේ එකට උපදින කියන එකයි. එකට උපදින ධර්ම වල අධිපති භාවයක් තියෙනවා. දැන් අර අපි ඉස්සෙල්ල ගත්තනේ උදාහරණයක්. ඒ උදාහරණයේ දහ දෙනෙක් ඉන්නවනේ. දැන් අපි හිතමු දහ දෙනෙක් යනවා මොකක් හරි වැඩක් කරන්න. ඒ වැඩක් කරන්ට යනකොට නම දෙනෙක් ඒ එක්කෙනෙකුට අනුයාත වෙන්න ඕන. එයා තමයි lead කරන්නේ. ඒවගේ මේ චෛතසික ධර්ම වල තිබෙනවා - සිත් වල

තිබෙනවා 'සහජාත = එකට' අර දහදෙනා එකට යන්න වගේ අරමුණක් සම්බන්ධයෙන් කටයුතු කරන කොට අරමුණක් දැන ගැනීම සඳහා සම්බන්ධයෙන් ඉදිරිපත්වෙන කොට ඒ ධර්‍ම වල තිබෙනවා එක්කෙනෙක් ඉස්සරහට එනවා අනිත් අය උදව් කරනවා. ඒ ගොල්ලන්ට උදව් නොකර ඉන්ට බෑ. ඒ ධර්‍මතා හතරක් තිබෙනවා. එකක් තමයි මතක තියා ගන්න අධිපතිත්වය දරාගෙන ප්‍රධානත්වය දරාගෙන වැඩ කරන එක ධර්‍මයක් තිබෙනවා ඒකට කියනවා ඡන්දය කියල. ඡන්දය කියල කියන්නේ චෛතසික ධර්‍මයක්. ඒක ප්‍රකීර්ණක චෛතසිකයන්ගේ එකක්. අනිත් එක තමයි වීර්යය කියල කියන්නේ. ඊළඟට චිත්ත = සිත. අනිත් එක විමංසා. අපේ මේ ගොඩාක් අභිධර්‍මය යටතේ පොත පත කියවපු පින්වතුන් මේ පිළිබඳව ධර්‍මය අහල දැනගෙන ඉන්න පින්වතුන්ට මේ කියන කොට තේරේවි. දැන්මේ ධර්‍මතා තියෙනවා 4 ක්. ඒ තමයි ඡන්ද - විරිය - චිත්ත - විමංසා. හැබැයි සමහර තැන්වල තියෙන්නේ ඡන්ද - චිත්ත - විරිය - විමංසා කියලයි. දෙකම එකයි පොඩ්ඩක් එහෙ මෙහෙ උනාට. ඡන්ද කියල කියන්නේ චෛතසික ධර්‍මයක්. විරිය කියල කියන්නෙත් චෛතසික ධර්‍මයක්. විමංසා කියල කියන්නෙත් චෛතසික ධර්‍මයක්. ඊළඟට චිත්තය කියල කියන්නේ සිත. චෛතසික ධර්‍ම තුනක් තිබෙනවා. ඡන්දයයි - විරිය - ප්‍රඥාවයි. මෙතන ප්‍රඥාව කියන එක වෙන නමකින් එන්නේ. එනම් 'විමංසාව' කියන නමින්. ඊළඟට ඡන්දය - විරිය - විමංසාව චෛතසික ධර්‍ම තුනක්. චිත්තය කියල කියන්නේ සිත. මේ ධර්‍ම එක අවස්ථාවකදී මොකක් හරි එක ධර්‍මයක් ප්‍රධාන වෙනවා. හැබැයි හතර දෙනාම ප්‍රධාන උනොත් එහෙම රණ්ඩුවක්. මෙතැන තියෙන්නෙ එකට පහළ වෙච්ච ධර්‍ම අනිත් ඒවා තමන්ට අවනත කරගෙන ඒ අරමුණ සම්බන්ධයෙන් වැඩ කරන ක්‍රියාව සිද්ධ කරනවා. ඔය ප්‍රත්‍යය විස්තරේ මේ විදියට කියවෙනවා.

**'ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො'** කියල කියනවා.

ඒ කියන්නේ ඡන්දය කියන චෛතසික ධර්‍මය නැත්නම් අධිපති ධර්‍මය ඒ ඡන්දය කියන චෛතසිකයත් එක්ක පහළ වෙච්ච සම්ප්‍රයුක්තක ධර්‍මයන්ට - එකට උපදින්නාවූ ධර්‍මයන්ටත් ඒ එක්කම ඒ චිත්තයත් එක්ක පහළ වන්නාවූ රූප යන්ටත් අධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියල.

අපි ඕක තේරුම් ගන්නේ කොහොමද කියන එකත් අපි හිතන්ට ඕනෑ. ටිකක් අපි මේක මේ විදියට සාමාන්‍ය ජීවිතයට යොදල තේරුම් ගන්ට ගියොත් එහෙම මෙහෙම තියෙනවා. එකක් කැමැත්ත අනිත් එක උත්සාහය අනිත් එක

අධිෂ්ඨානය අනිත් එක නුවණ. සමහර මිනිස්සුන්ට තිබෙනවා යම් කිසි දෙයක් කරන්ට හරි බලවත් කැමැත්තක් - බලවත් ආශාවක් - බලවත්ම ඕනෑකමක් තියෙනවා. ඉතින් සමහර අය වැඩ කටයුතු කිරීමේදී ඒ බලවත්ම ඕනෑකම - බලවත් ඡන්දය - බලවත් වූ කැමැත්ත මත තමයි ඉගෙනගන්ට හරි රස්සාවක් කරන්ට හරි මොහොකට හරි යන්නේ ඒ බලවත් කැමැත්ත නිසා. තද බල ආසාවක් තියෙනවා. ආන්න ඒ බලවත් ආසාව ආවහම - අපි හිතමු මෙහෙම - එයා සීතල සලකන්නේ නෑ - වරුසාව සලකන්නේ නෑ - කාලගුණය සලකන්නේ නෑ. ඇයි ඒ වැඩේ කරන්න තද ඕනෑකමක් තියෙනවා. ඊළඟට  ආහාර පානවල අඩුපාඩු කම් සලකන්නේ නෑ - තද බල කැමැත්ත නිසා. ඊළඟට මිනුස්සුන්ගෙන් එන ගරිහා  තර්ජන ගර්ජන අපහාස නින්දා ඒවා සලකන්නේ නෑ. ඒ කුමක් නිසාද? අර තදබල කැමැත්ත නිසා. දැන් බලන්ට මෙහෙම ගියාම අර තදබල කැමැත්ත නිසා - යමක් කරන්ට තියෙන තදබල ආසාව ඕනෑකම කැමැත්ත නිසා අනිත් ඒවා ඒකට වදින්නේ නෑ. ඒ කියන්නේ එයාව පෙළන්ට බෑ. එහෙම ගතියක් තියෙනවා. එහෙම තියෙන්නේ අර ඡන්දය බලවත් නිසයි. කරන්ට ඕනෑ කැමැත්ත බලවත් නිසයි. එයාගේ ඒ කැමැත්ත ඇතිවෙන කොට ඒකට අනුයාත වෙලා අනිත් චෛතසික ධර්මද සිතද එයාගේ ශරීරය - එයාගේ ක්‍රියාවල් - එයාගේ වචන ඔක්කොම ඒකට අනුයාත වෙලා තමයි වැඩ කරන්නේ. ඔන්න චන්දය නිසා.

**'ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො'** - ඔය එක්තරා විදියකට තේරුම් ගන්ට උපකාර වෙන්න කිව්වේ.

**දෙක** - සමහර මිනුස්සුන්ට තියෙනවා මෙහම එකක්. සමහර මිනිස්සුන්ට කැමැත්ත තියෙනවා යමක් කරන්ට හැබැයි උත්සාහය අඩුයි. කැමැත්ත තිබුනත් ඒ උත්සාහය අඩුනිසා පරක්කු වෙන්න පුළුවන්. ඇයි උත්සාහය දරන්නේ නැහැනේ. සමහර අයට කැමැත්තත් තියෙනවා. යමක් කිරීමේ කැමැත්ත තියෙනවා ඒවගේම තමයි ප්‍රධානව උත්සාහය තියෙනවා. කැමැත්ත තියෙන බව හැබැවයි උත්සාහය ප්‍රධානයි. සමහරුන්ගේ වීර්ය හරී ගොඩයි. ඒක නිසා වීර්ය වැඩෙන්ට වැඩෙන්ට වීර්ය වැඩිනම් එයාට ඒ වැඩේ කරගෙන යන්න පුළුවන්. හැබැයි එතැනදී ප්‍රධාන වෙන්නෙ-  යම්කිසි මනුස්සයකුට තද බල කැමැත්තක් තියෙනවා නම් ඒ කැමැත්තට යටත්ව තමයි වීර්ය රුකුල් දෙන්නේ. උදව් කරන්නේ. උපකාර කරන්නේ. එයාගේ කැමැත්ත තදින් තියෙන නිසා තමයි වීර්ය එයාට උදව් වෙන්නේ. සමහර අවස්ථාවලදී තියෙනවා මනුෂ්‍යා වීර්යයි, හොඳට ශක්ති සම්පන්නයි. ඒක නිසා ඒ වීර්ය වන්තයාට කැමැත්ත උදව් කරනවා

මේ විදියට කරගෙන යන්න කියල. ඒකනිසා වීර්ය ප්‍රධාන වෙනවා. වීර්යට යටත් උත්සාහයට යටත් අනිත් සෑම දෙයක්ම. ඔන්න සමහර අවස්ථාවලදී මනුස්සයාගේ කායික ක්‍රියා වාචසික ක්‍රියා මානසික ක්‍රියා චිත්ත චෛතසික ඔක්කොම weather එකද ආහාරපානද හැම දෙයක්ම අර උත්සාහයට යටත් වෙලා තමයි පවතින්නේ. ඔය එකක්.

අනිත් එක තමයි අපි කියනවා 'මනුස්සයා හරි පුදුමයි - පුදුම හිතක් එයාට තියෙන්නේ' කියල. 'පුදුම හිතක් තියෙන්නේ - හරි ධෛර්ය වන්තයි - පුදුම අධිෂ්ඨානය ශිලියි' කියල. මේ 'අධිෂ්ඨානශීලී' කියල මේ අපි කථා කරන්නේ මොකක්ද මේ? ඒක ඡන්දය නෙවෙයි. ඒක වීර්ය නෙමෙයි. වීර්ය වෙනයි ඡන්දය වෙනයි. අපි කියනවා එයාට තියෙනවා බලවත් හිතක්. කැමැත්ත නෙමෙයි බලවත් හිතක්. බලවත් හිතේ කැමැත්ත තියෙනවා හැබැයි මෙතැන තිබෙන්නේ අධිෂ්ඨානය ශක්තිය. 'චිත්තාධිපති' - ඒ සිතේ හරි හයියක් තියෙනවා. ආන්න ඒක නිසා සිතේ හයිය නිසා 'චිත්තාධිපති' වෙලා බලවත් වෙලා ඉස්සරහට කරගෙන යනවා.

ඊළඟට අනිත් කාරණය තමයි නුවණ. දැන් අධිෂ්ඨානය තිබුනත් කැමැත්ත තිබුනත් ඒවගේම වීර්ය තිබුනත් ඒවා කරන නුවණක් තියෙන්ට ඕනැ. සමහර වෙලාවට තියෙනවා මෙහෙම - තදබල කැමැත්තක් තියෙනවා. ඒ කැමැත්ත තිබුනට ඒ කැමැත්තම අල්ලගෙන වැඩ කරනව හැබැයි අර bypass කරන්න shortcut එහෙම දන්නේ නෑ. වීර්ය තියෙනවා වීර්ය වැඩ කරනවා සමහර වෙලාවට ඒ වීර්ය යොදන්ට ඕන තැන - අඩු කරන්ට ඕන තැන - ඒක දන්නේ නෑ. ඒ වීර්යට අනුයාත වෙච්ච තරමක තිබෙනවා දැනුමක් නුවණක්. ඔය විදියට වීර්යට යටත් වෙනවා - වීර්ය වන්තයාට සමහර වෙලාවට ප්‍රඥාව එහෙ මෙහෙ වෙන්න පුළුවන්.

තව එකක් තියෙනවා. ප්‍රඥාව තිබුනට පස්සේ එයා ප්‍රඥාවෙන් වැඩ කරන කොට ප්‍රඥාවට අනුයාතව තමයි ඡන්දය වැඩ කරන්නේ වීර්ය වැඩ කරන්නේ. එයා ඔය අනවශ්‍ය විදියට තද බල විදියට කැමැත්තක් දරාගෙන ඉන්නෙත් නෑ. අධිෂ්ඨානය තියෙනවා අධිෂ්ඨානය 'මම මේක කරනවාම' කියල එහෙම තදට අධිෂ්ඨාන කරන්නේ නැහැ. වීර්ය කරනවයි කියල උදේ ඉඳන් හැන්දෑ වෙනකල් වීර්ය දරාගෙන ඉන්නෙත් නෑ. එයා දන්නව අඩුකරන තැන - ක්‍රියාත්මක කරන තැන - නිදහසේ ඉන්න තැන. හැමතැනටම මෙයාගේ නුවණ වැඩ කරනවා. එනිසා අනිත් ක්‍රියාවල් සියල්ලක්ම එයාගේ ජීවිතයේ හැසිරෙන්නේ ප්‍රඥාවට යටත්ව.

දැන් මෙතැන තියෙන ධර්මතා 4 ක් ඡන්දය - විර්යය - අධිෂ්ඨානය හෙවත් චිත්තය - විමංසාව හෙවත් ප්‍රඥාව යන මේ ධර්මතා හතරෙන් එකක් එක වෙලාවකට ඒ එක හිතක ඉදිරිපත්වෙලා ක්‍රියාත්මක වෙනවා. ඒ වෙලාවට ඒ ධර්මයට අනුයාතව තමයි අනිත් ඇති වන්නාවූ සෑම දෙයක්ම - චිත්තයද - චෛතසිකද ඔක්කොම ඇතිවෙන්නේ.

දැන් මම මේ වෙනකම් කිව්වා අධිපති ධර්ම 4 පිළිබඳව. තව තියෙනවා මෙහෙම **වීමංසාධිපති වීමංසසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො** - ඒ කියන්නේ ප්‍රඥාවත් එක්ක එකට පහළ උනාවූ අනිත් චිත්ත චෛතසික ධර්මයන්ටත් ඒ වගේම ඒ හා එකට උපදින්නාවූ පහළ වෙන්නාවූ චිත්ත සමුට්ඨාන රූපයන්ටත් අධිපති භාවයෙන් ඉදිරිපත් වෙනවා - ප්‍රත්‍යය වෙනවා.

යම්කිසි ධර්මයක් ගරුකරලා යම් කිසි ධර්මයක් මුල් කරගෙන යම් යම් චෛතසික ධර්මයෝ පහළ වෙනවනම් ඒ හැම අවස්ථාවකදීම ඒ ඒ ධර්මයන්ට මේවා අධිපති වෙනවා කියන එක තමයි කියන්නේ.

ඔයටික ඔහොම ඉගෙනගෙන දැන ගෙන අපි තව පැත්තකට පොඩ්ඩක් යොමු වෙමු. නැවත වතාවක් අපි සිහිගන්වා ගනිමු හිතට 'සහජාතාධිපති' කියන්නේ මොකක්ද? සහජාත කියන්නේ එකට පහළ වෙනවා කියන එකනේ. එකට උපදින - එකට හටගන්නා - එකට පහළවෙන ධර්ම වල - එකවෙලාවකට ඒ රංචුවේ අනිත් ටික තමන්ට පාලනය කරගෙන තියන්න පුළුවන් ගතිය තියෙන - ඒ හැකියාව තියෙන ධර්මයට කියනවා සහජාත අධිපති ධර්මය කියල. එතන විශේෂයෙන් සහජාත ධර්මය කියල කියන්නේ එකට උපන් - ඒ කියන්නේ අධිපති වෙන්න නම් තව කොටසක් ඒ වෙලාවට ඉන්න ඕනෙනේ තමන්ට යටත් වෙන.

ප්‍රත්‍යය ධර්ම 4 තමයි ඔය. ඡන්දය - විරිය - චිත්ත - විමංසාව. දැන් මේ 4 දෙනා යම් කිසිවෙලාවක ඒ ඒ වෙලාවේදී ශක්තිමත් උනොත් බලවත් උනොත් අධිපති උනොත් අධිපති කමට යටත්වී ක්‍රියාත්මක කරන ධර්ම මොනවාද? ඒවා තමයි ඡන්දය තිබෙන්නාවූ සිත්වල පහළ වන චෛතසික ධර්ම 52. චෛතසික ධර්ම 52 න් අර ඡන්දය කියන එක අධිපති වෙන කොට අනිත් චෛතසික ධර්ම 51 යි. විමංසා ව අධිපති උනොත් විමංසාව නැතුව 51යි. චිත්තය අධිපති උනොත් චෛතසික ධර්ම 52 යි. වීර්ය අධිපති උනොත් වීර්ය අයින්කරලා චෛතසික ධර්ම 51 යි. ඔට විදියට අධිපති වෙන වෙලාවට ඡන්දය ක්‍රියාත්මක වෙන වෙලාවට ඡන්දය ප්‍රධානයි නම් බලවත්නම් අනිත් ඒවා ඔක්කෝම ඒ බලයට යටත්ව

ක්‍රියාත්මක වෙන චෛතසික ධර්මයෝ - සිත - ඊළඟට හටගත්ත චිත්තජ රූප මේ සියල්ලක්ම ප්‍රත්‍යය උප්පන්න වෙනවා. මේ වචනය කියන කොට තියෙනවා ප්‍රත්‍යය උප්පන්න කියල. ප්‍රත්‍යය උප්පන්න කියල ඇහෙනකොට කෙනෙකුට තේරෙන්නේ මේවගෙන් උපදිනවා කියල හැබැයි ඒ කතාවක් නෙමෙයි මෙතන තියෙන්නේ. ප්‍රත්‍යය උප්පන්නය කියල කියන්නේ අර අධිපති ධර්මය වැඩ කරන වෙලාවේදී එයා ඉක්මවා යන්න බැරුව - අධිපති ධර්මයට අනුකූල වෙලා පවතින්නා වූ ධර්ම වලට තමයි ප්‍රත්‍යය උප්පන්න ධර්ම කියල කියන්නේ. අපි ඕක තේරුම් ගන්ට තවත් මේ විදියේ උපකාරයක් කර ගනිමු.

ඒ තමයි අපි හිතමු දැන් හිතක් පහළ වෙනවා කියලා. ලෝභ මූල හිත් තියෙනවා 8 ක්. ඒ ලෝභ මූල සිත් 8 පහළ වෙනවා චෛතසික ධර්ම සමූහයක්. ඒ හිතයි චෛතසික ධර්ම සමූහයයයි එක පොකුරටනෙ පහළ වෙන්නේ. මනුස්සයෙක් මොනව හරි තිබෙන්නාවූ දේකට - වස්තුවකට ආසාවක් කරනවා. ආසාව කරන වෙලාවේදී එයාගේ හිතේ පහළ වෙන්නාවූ ලෝභ හිතක් තියෙනවා. ඒ ලෝභ හිතේ ලෝභය තියෙනවා. ඒවගේම ඡන්දයත් තිබෙනවා ඊළඟට විරියත් තිබෙනවා. අකුසල ධර්ම නිසා ප්‍රඥාව නෑ. හිතක් තිබෙනවා. දැන් මේ මනුස්සයාට තද බල විදියට තිබෙනවා ඒකට වස්තුවට ලෝභ කරන්ට කැමැත්තකුත් තියෙනවා. ගන්ට කැමැත්තකුත් තියෙනවා. ඒවගේ වෙලාවට එයාගේ ඒ ලෝභ සිතේ පහළ වෙච්ච ලෝභය එහෙම නැත්නම් හිතයි එයාගේ හිතේ පහළ වෙච්ච ඒ හිතේ තියෙන වීර්ය චෛතසිකයයි එයාගේ ශරීරයේ පහළ වෙන චිත්තජ රූපයි ඔක්කොම ටික අර ඡන්දයට යටත් වෙනවා. ඔය වගේ අවස්ථාවකදී ඡන්දය අධිපති වෙනවා. මේ උදාහරණයක් හැටියට. කෙනෙකුට අහන්න පුළුවන් ඕකේ ලෝභය නේද තියෙන්නේ කියල. ලෝභයත් තියෙනවා. ලෝභය කථා කරන තැනක් තියෙනවා. ඒක මේ අවස්ථාවේදී කථා කරන්නේ නෑ. මෙතනින් කථා කරන්නේ අර ප්‍රධාන 'හේතු' ධර්ම නෙමෙයි. අපි මේ ලෝභය කියන එක ඉස්සෙල්ලා 'හේතුවක්' හැටියට කථා කරලා තියෙන්නේ. මේ දැන් කථා කරන්නේ අනිත් චෛතසික ධර්ම ටික නතුකරගෙන පවත්වන අධිපති ධර්ම 4 විතරයි.

අපි හිතමු මේ වීර්ය තියෙනවා. දැන් යමක් තමන්ට ගන්න ඕනෑ. යමක් බලෙන් - අනෙක් කෙනෙක් නුදුන් දෙයක් - බලෙන් ගන්ට හිතාගෙන ඉන්නවා. ඒ හිතාගෙන ඉන්න කොට එයාගේ තියෙනවා උත්සාහයක් ඒකට. ඒ උත්සාහයේ ලෝභයත් තියෙනවා - ලෝභයට අනුකූලව ගියාවූ උත්සාහයත් තියෙනවා. ඒකට කියනවා වීර්ය කියල. ඒ වීර්යට අනුයාත වෙනවා අනිත් චෛතසික ධර්ම ටික එහෙම නැත්නම් හිත. දැන් මේ ලෝභ හිතෙන් ලෝභ කරන කොට ලෝභ

හිතෙන් යමක් ගන්ට plan කරනකොට මේ හැම තැනකදීම ඒ එක ධර්මයකට අනුයාත වෙනවා අනිත් ධර්ම සමූහය. අන්න ඒක නිසා තමයි කියන්නේ සහජාත ධර්මයෝ අනිත් ඒවාට ප්‍රත්‍යය ධර්ම හැටියට - මෙහෙය වීම් හැටියට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා කියල. අනිත් ධර්ම ටික ඔක්කෝම මේ ප්‍රධානියාට අනුයාත වෙනවා. මේක අර අපි Electricity ගැන කථාකලානේ ඉස්සෙල්ලා. Electricity ගැන කථා කලාට පස්සේ එකේ තියෙන ටික බලන්ට - දැන් විදුලිය නිසා ඒ විදුලියේ තිබෙන්නාවූ බලය නිසා කීදෙනෙක් ඒ පැත්තට නතුව වැඩ කරනවද - වයර් දාන අය ඉන්නවා - කණු හිටවන අය ඉන්නවා - වයර් හදන අය ඉන්නවා - කණු හදන අය ඉන්නවා - cabel දාන අය ඉන්නවා - switch හදන අය ඉන්නව - switch දාන අය ඉන්නවා. ඊළඟට ඒ generators operate කරන අය ඉන්නවා. මේ හැම එක්කෙනාගේම - මේ ඔක්කෝම කරන්නේ - මේ ඔක්කෝගෙම වැඩ - ළඟ වශයෙන් - දුර වශයෙන් ඉඳගෙන මේ කරන වැඩ ඔක්කොටම ටික කරන්නේ - ප්‍රධාන කවුද? විදුලිය. ඒක නිසා විදුලිය ප්‍රධාන උනායින් පස්සේ අනිත් අය ඔක්කෝම - මොන නම්වලින් කිව්වත් - මොන ආයතනයේ හිටියත් - මොන දේවල් කරත් ප්‍රධාන අරක. ආන්න ඒ වගේ මේ ඡන්දයයි සිතයි වීර්ය යයි විමංසාවයි කියන මේ ධර්මතා 4 එක දෙයක් කිරීමට - එක දෙයක් කරන අවස්ථාවේදී අනිත් ඔක්කෝම ටික ඒ පැත්තට නතු කරගන්නවා.

දැන් අපි හිතමු මෙහෙම - අපිට භාවනා කරන කොට ඕනෑ වෙනවා විපස්සනා ඥාන ධර්ම උපදවා ගන්ට. විපස්සනා ඥාන ධර්ම දැන් නෑ. විපස්සනා ඥාන ධර්ම උපදවාගන්ට ඕනෑ. දැන් මේ විදර්ශනා ඥාන ධර්ම ලබාගන්න ඕන නිසා අපිට කැමැත්තක් ඇතිවෙනවා. ඒ කැමැත්තෙන් අපි ඒක target කරගෙන ඒ පැත්තට නැමිලා ඒ පැත්තට හැරිලා ඒක ලබාගැනීමේ උත්සාහයක් හැටියට ලබාගැනීමේ කැමැත්තෙන් ඒ සඳහා අපි හොඳට දැන් කටයුතු කරගෙන යනවා. දැන් මේ ලබාගන්ට මොකක්ද අපි target කරේ? විදර්ශනා ඥාන. ඒනිසා කරන්නේ මොකක්ද ඒකට කැමැත්ත තැබුවා - කැමැත්ත තියෙනවා වගේම තමයි අනිත් වීර්ය ඊළඟට ඒ කැමැත්ත නිසා තමයි අපි ආසන හදන්නේ - ශාලාවල් හදන්නේ - කුටි හදන්නේ - ආහාරපාන ගැනීම් ආදිය කරන්නේ. හැම එකක්ම අර ප්‍රධාන දේ ලබාගන්ට. ඔය උදාහරණයක්. ඒකට කැමැත්ත දැම්මොත් ඡන්දය ප්‍රධාන වෙනවා. වීර්ය කරන කොට ඒත් ඒ වගේ. ප්‍රඥාව වඩාගෙන යනකොට ඒත් ඒවගේ. ඔය විදියට අපි කරන සෑම දේකදීම ඔය එක්කෙනෙක් ප්‍රධාන වෙනවා. අනිත් අය අනුයාත වෙනවා.

සත්තිස් බෝධි පාක්ෂික ධර්මවල බෝධි පාක්ෂික ධර්ම 4 ක් හැටියටත් මේක කියවෙනවා. මේ ප්‍රත්‍යය ධර්මයන්හි අධිපති ප්‍රත්‍යය ධර්මය හැටියට මේ 4 කථා කරනවා හිත්වල. අනිත් එක තමයි මේවගේ බල පෑමක් නැතිවෙන ඒවත් තියෙනවා. අපි පස්ස වෙලාවක ඒක කථා කරමු.

දැන් එතකොට මම කියල දුන්නේ මොකක්ද? සහජාත අධිපති භාවයට උපකාර වෙන්නාවූ සහජාත අධිපති ධර්ම 4 ක්. ඒ තමයි ඡන්දය කියන චෛතසික වීර්ය කියන චෛතසිකය - හිත - අනිත් ඒක තමයි විමංසා හෙවත් ප්‍රඥාව කියන චෛතසිකය.

මීට කලින් අප කථාකරා ආරම්මණය පිළිබඳව. ඒකට කියනවා චිත්ත චෛතසික ධර්මයන් පහළ වීම සඳහා උපකාරක වෙන්නාවූ අරමුණු. අරමුණක් එපායැ. එකක් තමයි මේ ධර්ම ටික සහජාත ධර්ම හැටියට උපකාර වෙනවා වගේම චිත්ත චෛතසික ධර්මයන්ට අරමුණ කියන එකත් උපකාර වෙනවා සිත් පහළ වෙන්ට. ඒක නිසා අරමුණට වෙන නමක් තියෙනවා. අරමුණට කියනවා 'ආරම්මණ අධිපති භාවය' කියල. ඒ ආරම්මණ අධිපති බවත් සමහර අරමුණු තිබෙනවා හරී බලවත්ව. ඒවා අමතක කරවන්ට හරි අමාරුයි. ඒක නිසා ඒවගේ දේවල්වලට කියනවා ආරම්මණ බලවත් භාවය හෙවත් ආරම්මණය අධිපති වෙනවයි කියල.

දැන් යමක් ප්‍රධාන අරමුණක් - නගරයක කුළුණක් - ඔරලෝසු කණුවක් - ගොඩනැගිල්ලක් - එහෙම උනායින් පස්සේ ඒක දිහා බලනවා - වැඩියෙන් හිතනවා. ඒ අරමුණක් හැටියට ඒක ලොකු නිසා. පූජනීය වස්තුවක් හැටියට ගත්තයින් පස්සේ - දඹදිව - අනුරාධපුරය - කිරිවෙහෙර - ඒවගේම දළදා මාලිගාව ඔය වගේ පූජනීය වස්තු හැටියට - මේවත් අරමුණු හිතට. මේවා ගැන වැඩියෙන් හිතනවා. කුසල වෙන්න පුළුවන් අකුසල වෙන්න පුළුවන්. ඒවගේ අවස්ථාවල ඒ අරමුණේ තිබෙන්නාවූ බලවත් බව නිසා චිත්ත චෛතසික ධර්මයෝ හෝගාල ඒ පැත්තට නතුවෙලා වැඩ කරනවා.ඒකට කියනවා ආරම්මණාධිපති භාවය කියල. හැබැයි ආරම්මණාධිපති භාවය එකක්. සහජාත අධිපති භාවය එකක්. අද මේ කථාකරේ මොකක්ද? සහජාත අධිපති ස්වභාවය. ඒ නිසා අපි මේටික මේ විදියට දැනගෙන තවත් ටිකක් අපි ඉස්සරහට සකච්ඡා කිරීම් වශයෙන් එක්කාසු කරගෙන ධර්මඥානය දියුණු කරගන්නත් අපි උත්සහ කරමු. මහන්සි ගනිමු. මේ පිංවත් සැම දෙනාටම මේ පිළිබඳව හිතල මෙනෙහි කරලා ධර්ම අවබෝධය කරගන්ට ශක්තිය ලැබේවා! ඒවාගේම අපි හොඳට මතක තියාගන්ට මේ ධර්ම මණ්ඩලයේ - මේ සමූහයේ අනිත් චෛතසික ධර්මයන්ට බලපෑම් කරන්නාවූ ප්‍රධාන චෛතසික ධර්ම 3 ක් සහ සිත අධිපති හැටියට වැඩ

කරනවා - ක්‍රියාත්මක වෙනවා කියන එක. අපි දැන් මෙතන ඉදල ඉස්සරහට සාකච්ඡා වශයෙන් ගෙනියමු. අපේ පින්වතුන් මේක අහල - මට මතක හැටියට මේක මම මීට ඉස්සෙල්ලා යම් කිසි දවසක කිව්වාය කියලා. ඒක එහෙම නොවුනා නම් අලුත් දෙයක් වෙන්න පුළුවන්. යම්කිසි ප්‍රධාන කාරණයක් තිබුනොත් මේකට එක්කාසු කරගන්ට අපි ඒවා මේකට අදාළ කරගෙන කියමු. ලොකු එකක් තුබුනොත් මාතෘකවක් හැටියට වෙනම ගනිමු. හොඳයි හැමදෙනාටම තෙරුවන් සරණයි! ප්‍රශ්න තියෙන ඒවා අහන්ට.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස එක තැනක තියෙනවා ස්වාමීන්වහන්ස විචිකිච්ඡාවත් අන්‍ය චෛතසිකයෝ - මේ දැන් අධිපති ධර්‍ම හැර ....... පහැදිලි මදි

<u>පිළිතුර</u> - එහෙම තියෙනවා චෛතසික ධර්‍ම කීපයක්ම තියෙනවා. ඒකෙන් විචිකිච්ඡාව අයින් කරනවා. කුකුසයත් අයින් කරනවා. එහෙම අයින් කරන්නේ ආරම්මණ අධිපති ප්‍රත්‍යය ගැන විග්‍රහ කරන කොට තමයි ඒක අයින් කරන්නේ මෝහ මූල සිත් දෙකේ. විචිකිච්ඡා සිතේ. ඒක ප්‍රත්‍යය ධර්‍මයක් හැටියට වැඩ කරන අවස්ථාවේදී ඒක එන්නේ නෑ. දැන් අපි ප්‍රත්‍යය උප්පන්න ධර්‍ම හැටියට කිව්වේ ඔය අධිපති ධර්‍මයන්ට අයත් වන දේවල්නේ. ඒකෙ ආරම්මණ ප්‍රත්‍යය යටතේ කථා කරනවා ලෝභ සිත් 8 කුසල් සිත් 8 ත් ඊළඟට අනිත් ඒවාගෙන් ඥාන සම්ප්‍රයුක්ත ක්‍රියා සිත්. ඒ හිත් හැටියට. චෛතසික ධර්‍ම ගත්තයින් පස්සේ තියෙනවා 45 ක් ප්‍රත්‍යය උප්පන්න භාවයට යන්නේ නෑ - ඒක අවස්ථානුකූලව - ඒ තමයි ද්වේශ චෛතසිකය ඊට පස්සේ ඊර්ෂ්‍යාව චෛතසිකය ඊළඟට මසුරු බව මච්ඡරිය කුකුස විචිකිච්ඡා කරුණා මුදිතා මේ කියන්නාවූ චෛතසික ටික ඇර අනිත් ඒවා ප්‍රත්‍යය උප්පන්න ධර්‍ම හැටියට ඉදිරිපත් වෙනවා.

බොහොම පිං සවාමීන්වහන්ස තව පොඩි ප්‍රශ්ණයක් අහන්න තියෙනවා. භාවනාවක් කරගෙන යන කොට මුලදී සමහරවිට ඡන්දය බලවත් වීමෙන් හරි වීර්‍ය බලවත් වීමෙන් හෝ අපි යම් කිසි භාවනාවක් කරගෙන යනකොට එතැනදී අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. පසුව අපි වීර්‍ය අඩු උනත් සමහර විට නුවණ වැඩි වීමෙන් තව දුරටත් කරගෙන යාමට හැකියාව ලැබෙන කොට එතැන මුලදී පටන් ගන්න අධිපති ප්‍රත්‍යය වෙනුවට වෙනත් අධිපති භාවයකින් ප්‍රත්‍යය වෙනවද ස්වාමීන් වහන්ස. ඒ විදියට ගන්න පුලුවන්ද ස්වාමීන් වහන්ස.

<u>පිළිතුර</u> - අධිපති ප්‍රත්‍යය විස්තර වෙනවා ආකාර දෙහෙකට. එකක් තමයි ආරම්මණ අධිපති ප්‍රත්‍යය ශක්තිය කියනවා අනිත් එක සහජාත අධිපති ප්‍රත්‍යය ශක්තිය ගැන කියනවා. අපේ මේ පින්වතුන්ට මම අදහස් කරන හැටියට

ඉස්සරවෙලාම මේකේ ආරම්මණ අධිපති භාවය දැනගන්නවට වඩා සහජාත අධිපති භාවය සලකා ගැනීම හරි ප්‍රයෝජනවත් වෙනවා කියල. ධර්‍ම දැනුමේ හැටියට දෙකම දැන ගන්න එක හොඳයි නමුත් හොඳටම විස්තර කරන්නේ අධිපති ප්‍රත්‍යයයේ ධර්‍මතා 4. ඡන්ද - චිත්ත - විරිය - විමංසා යන හතර. ඕක හොඳටම දැන් ගන්න එක හොඳයි. මට ඒක කියන්න මතක් උනේ මේ ප්‍රශ්නයත් එක්ක.

ඊළඟට අපේ මේ මහත්තය කියපු හැටියට අපි භාවනා කරන කොට එක වෙලාවකට එක ධර්‍මයක් ප්‍රධාන වෙනවා. දැන් ඔය භාවනා කරගෙන යනකොට සමහරු භාවනා කරන්න කැමතියි. භාවනා කරන්න කැමැත්තක් තියෙනව. දැන් මේ කාලේ මෙහෙත් ඔය භාවනා කරන්ට එනවා. භාවනාව කරන්ට කැමතියි හැබැයි මෙලෝ දෙයක් දන්නේ නෑ. ඔය කැමැත්තක් තියෙනවා. ඒ කැමැත්තක් ඇවිල්ල තියෙනවා ඒකට interest එක කියල කියමුකෝ. ඒ අර වටපිටාවේ මිනිස්සු කථාකරනවා - බටහිර මිනිස්සු mindful කියනවා - investigation කියනවා Four Noble Truths කියනවා ඉතින් අර හතර වටේම මෙහෙම ඒවා office වලයි පාරෙයි බස් වලයි පත්තර වලයි ඔහොම කියනකොට ඒ අනිත් අය කියන කතාවල් - බලන පොත පත අනුසාරයෙන් තමන්ට interest එකක් හැදෙනවා. කැමැත්තක් හැදෙනවා. ඔන්න දැන් එනවා. දැන් භාවනා කරන්ට ඇවිල්ල දැන් පටන් ගන්නවා. භාවනා කරන්න එන්නෙම කැමැත්තක් ඇතිවෙලා. මොකක් හරි දෙයකින් කැමැත්තක් ඇතිවෙලා. හැබැයි අධිෂ්ඨානයක් නෑ. ඉඳගන්ට බෑ - වීරිය නෑ - කොහොමද මේක කරන්නේ කියල කිසිම දැනුමක් නෑ - නුවණක් නෑ. හැබැයි භාවනා කරන්ට එනවා. ඔහේ ඇවිල්ල ඉතින් ඉන්නේ - ඒ ඉන්න ටිකටවත් උපකාර උනේ අර ඡන්දය නිසා. මොකෙන් හරි පොළඹවා දීපු ඡන්දයක් නිසා. දැන් ඔන්න ඡන්දයෙන් ඉතින් එනවා. අනිත් අයත් එනවා - මාත් එනවා ඔහොම ඇවිල්ල ඊට පස්සේ අනිත් අය දිහා බලාගෙන ඉන්නවා. බලගන ඉන්න කොට ඒ අය හොඳට වාඩි වෙලා ඉන්නව - පැය බාගය විනාඩි 45 ඉන්නවා - පැය ඉන්නවා - ඔහොම ඔහොම ඉන්න කොට මෙයාට හිතෙනවා ‘මාත් කොහොම හරි පැය බාගයක් හමාරක් මේ විදියට ඉන්න ඕන ’ කියල එයාට හැඟෙනවා - දැන් භාවනාවේ ඉස්සරහට ඉඳගෙන ඉන්න. එතකොට එයා ඉන්නවා. හිත දුවනවා උනත් හොඳට දැඩිව අධිෂ්ඨානයෙන් ඉන්නවා. අධිෂ්ඨානයෙන් ‘මම පැය බාගයක් ඉන්නව’ කියල පැය භාගයක් ඉන්නව. පැය භාගය ඉන්නේ අධිශ්ඨානයෙන් මිසක ඉන්නේ කැමැත්තෙන් නෙමෙයි. පැය බාගය ඉන්න අමාරුයි. කකුල් කකියනවා ඇඟ රිදෙනවා හැබැයි අධිෂ්ඨාන කර ගත්ත අනිත් අයත් ඉන්න නිසා මාත් ඉන්නවා පැය බාගයක් - මමත් ඉන්නව පැයක් කියල. දැන් එතකොට බලන්න අවේ මොකෙන්ද? ඡන්දයෙන් ඉඳගෙන

ඉන්නේ මොකෙන්ද? අධිෂ්ඨානයෙන්, හැබැයි ඉඳගෙන ඉන්නෙ කැමැත්තකින් නෙවෙයි. ඉතින් අර අධිෂ්ඨානයට දෙවෙනුව චිත්තය බලපෑවා .

තවත් එකක් - ඔහොම යන කොට යන කොට භාවනාවෙන් කැමැත්ත ආව. පරිසරයත් හුරු උනා. මිනිස්සුත් හොඳයි. දැන් ටිකක් ඉඳගෙන ඉන්නත් පුළුවන් ඊට පස්සෙ හිතනවා 'මම මේකට හොඳ විර්යක් දාන්න ඕන' කියල තව ටිකක් වීර්ය වැඩිකරනවා. දැන් ඊළඟට වීර්යෙන් යනවා. අධිෂ්ඨානයත් තියෙනවා වීර්යයෙන් යනවා. ඊට පස්සෙ මොකද කරන්නේ තවත් ඔය අනිත් අය කියන කතාවල් සාකච්ඡා ඕව ගැන අහල ඊට පස්සෙ භාවනා නිමිති කියන්නේ මොනවාද - ඒවා හඳුනා ගන්නේ කොහොමද - ඊට පස්සෙ වීර්ය කරන්නේ කොහොමද - ඉඳ ගන්නේ කොහොමද කියල දැන් ඔන්න තව දැනුමකුත් එක්කාසු කර ගන්නවා. ඒකත් එක්ක යනවා. දැන් එතකොට පස්සෙ එයා ඒ තරම්ම අදිෂ්ඨාන කිරිලි අරවමේවා නෑ. හැම වෙලේම නුවණ ප්‍රධාන කරගන්නවා. එතකොට ඒ අවස්ථාවේදී නුවණ ප්‍රධාන වෙනවා. එතකොට එකවෙලාවකට අපි භාවනා කරන කොට ඡන්දය ඉදිරිපත් වෙනවා ප්‍රධාන හැටියට. සමහර වෙලාවට වීර්ය එනවා ප්‍රධාන හැටියට. සමහර වෙලාවට නුවණ එනවා ප්‍රධාන හැටියට. සමහර වෙලාවට හිත එනවා. ඔය භාවනා කරන අවස්ථාවල් වලදී සමහර ආසන වල ඡන්දය බලවත්. සමහර අවස්ථාවලදී වීර්ය බලවත්. සමහර අවස්ථාවලදී චිත්තය බලවත්. සමහර අවස්ථාවලදී විමංසාව හෙවත් ප්‍රඥාව බලවත්. ඉතින් ඕකේ සමහර වෙලාවට එකම පැයක් ඉඳගෙන ඉන්න අතරතුර ඔය වැඩ කටයුතු වලදී එකක් දෙකක් ප්‍රධාන වෙන්න පුළුවන්. ඒ විදියට තමයි වෙන්නේ. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වල නිවන් අවබෝධ කරගන්න මාර්ග සිතේ විතරයි ඔය ඔක්කොම සමව වැඩ කරන්නේ අනිත් හැම අවස්ථාවකදීම එකක් ප්‍රධාන වෙනවා.

බොහොම පිං ස්වාමීන්වහන්ස

<u>ප්‍රශ්නය</u> - එතකොට සවාමීන්වහන්ස ලෝකෝත්තර හිත් වල ඔය සහජාත අධිපති ප්‍රත්‍යයයෙයි ආරම්මණ අධිපති ප්‍රත්‍යයයෙයි දෙකෙන් එකක්ද අධිපති භාවයට පත්වෙන්නේ එක තැනකදී කියන එක තමයි මට අහගන්න උවමනාව තිබුනේ. මොකද සවාමීන් වහන්ස මෙතන සහජාත අධිපති ප්‍රත්‍යය වෙනකොට ලෝකෝත්තර සිත් අරන් නැහැ ප්‍රත්‍යය උප්පන්නයට එනවා කියල සඳහනක් නැති නිසා මේකෙන් අපි තේරුම් ගන්න වෙන්නේ එතකොට ආරම්මණ අධිපති වෙනකොට ලෝකෝත්තර සිත්වල ප්‍රඥාව තිබුනත් ප්‍රධානත්වය අරන් තියෙන්නේ ආරම්මණ අධිපති ප්‍රත්‍යයයෙන්ද කියන එක ප්‍රත්‍යය උප්පන්න

භාවයට ලෝකෝත්තර සිත් එන්ට. සහජාත අධිපත ප්‍රත්‍යය ඇයි ප්‍රත්‍යය උප්පන්න භාවයෙන් ලෝකෝත්තර ආවේ නැත්තේ කියන ප්‍රශ්නේ උඩ තමයි සවාමීන්වහන්ස මම එහෙම තේරුම් ගත්තේ. ඒක හරිද සවාමීන්වහන්ස.'

පිළිතුර - ඇත්ත වශයෙන්ම අපි ආරම්මණ අධිපති භාවය ගැන කථා කරන කොට මේකේ දෙකක්ම තියෙනවා. එක වෙලාවකට ආරම්මණ අධිපති බවත් ක්‍රියාත්මක වෙනවා වගේම සහජාත අධිපති බවත් - ඔය හතරෙන් එකක් ක්‍රියාත්මක වෙනවා. ඒ දෙකම තියෙනවා නමුත් අපේ ශ්‍රාවක මණ්ඩලයට පහසුවක් වෙන හින්දාවෙන් අර සහජාත ධර්මික දැනගැනීම හරි ප්‍රයෝජනවත් වෙනවා. හේතුව අපි පහුගිය දවස්වල ආරම්මණ ධර්ම ගැන කියපු නිසා. අරකත් ඒ එක්කම ඇඳිලා එනවා. තව එකක් තමයි ඔය ලෝකෝත්තර ධර්මයි ලෞකික ධර්මයි ගැන කථා කිරීමේදී අපේ පින්වතුන් සැම දෙනාම දැනගන්න එක හොඳයි මේ ලෞකික ධර්ම කථා කරන කොට හිතට මුල් තැන දීල කථාකරන ස්වභාවයක් තියෙනවා හැබැයි ලෝකෝත්තර ධර්ම ගැන කථාකරන කොට ප්‍රඥාවට මුල් තැන දීල කථා කරනවා ස්වභාවයක් තියෙනවා. හේතුව ලෞකික දේවල්වල කාම - රූප - අරූප යන සථානවල 'සිත' ප්‍රධානයි. අනිත් ඒවා නෑ කියන එක නෙමෙයි 'සිත' ප්‍රධානයි. හැබැයි මාර්ග අවස්ථාවේදී ප්‍රඥාව ප්‍රධානයි. ඒක නිසා අරමුණක් දැන ගැනීමේදී ලෞකික වශයෙන් ප්‍රඥාවත් තිබෙනවා හැබැයි ඒ ප්‍රඥාව හිතට ගිහිල්ලා බැහැගෙන තමයි - හිතෙනුයි ප්‍රඥාවෙනුයි දෙකෙන්ම - හැබැයි නිවනේදී නිවන් අරමුණු කරන්නෙම ප්‍රඥාව මුල් වෙලා. ඒක නිසා විමංසා ව කියන ධර්මය එතනදී නිවන් දැකීම සඳහා නිවන් අරමුණු කරන්ට ඒක ඉදිරිපත් වෙනවා. එතකොට මෙහෙම එකක් තියෙනවා. එතැනදී නිවන් දකිනකොට දැකීමේ ක්‍රියාව සිද්ද කරන්නේ මේ පැත්තේ ඉඳලානේ - මෙතෙර ඉඳල කියල කියමුකෝ. එතකොට නිවන එහාපැත්තෙ ඉඳල පේනවා කියල හිතමුකෝ අපි. එතකොට එහාපැත්තෙන් නිවන පේනකොට අරමුණක් තියෙනවා. නිර්වාණ ධාතුව ආරම්මණ ප්‍රත්‍යය සිද්ද කරනවා. ඊළඟට මෙහා පැත්තේ ඉඳල නිවන් පැත්ත බලනවා. බලන කොට ඒ බලන්නාවූ හිතට සහ ප්‍රඥාවට නිවන ඒ පැත්තේ ඉඳල අරමුණු වෙනවා. මෙහෙන් ප්‍රඥාව හිත වහගන්නව. ප්‍රඥාව හිත හොඳට බලවත් ලෙස හිත වහගෙන හිත dominate කරලා ප්‍රඥාව වැඩිපුර ශක්තියක් අරගෙන ඊට පස්සේ නිවන අරමුණු කරනවා. එකේදී හැබැයි මෙහෙම කියනවා. ඔතනදි බෝධිපාක්ෂික ධර්ම 37 ක් තියෙනවා. ඔය බෝධිපාක්ෂික ධර්ම 37 සමව ක්‍රියාත්මකවන අවස්ථාවක් තමයි ඔය මාර්ග අවස්ථාව. ඒක නිසා මාර්ග ඥාන කියනවා - අපි ව්‍යවහාරයට මාර්ග සිත් කියනවා. මාර්ග ඥාන කියල කියන්නේ- සෝවාන් මාර්ග ඥානය යනාදිය. එතකොට මේකෙ තිබෙනවා බැලීමේ මහා ශක්තියක් - හිත යටත් කර පවත්වාගන්න ශක්තිය තිබුනත් අනෙත් ඒවා

ඔක්කොම මාර්ග ඥානයට - ප්‍රඥාවට රජ තුමා හැටියට සලකලා උදව් කරන්න වගේ  උපකාරවෙන ගතියක් තියෙනවා. ඒකනිසා බෝධිපාක්ෂික ධර්ම 37 ම සමව මාර්ග සිතක වැඩ කරනවා. ඒක කියන්න හේතුව සමහර වෙලාවට කෙනෙක් මෙහෙම කියාගෙන යනකොට හිතන්ට පුළුවන් දැන් ඡන්දය ප්‍රධාන වෙලා නිවන් දැක්කොත් එතකොට තව තුනක් තියෙනවනේ එතකොට ඒ තුන නැති උනොත් එහෙම 37 න් බෝධිපාක්ෂික ධර්ම 34 ක් විතරයි තියෙන්නේ අනිත් ඒවා නැහැ කියල. එහෙම වෙන්නේ නෑ මේකේ තිබෙනවා නිවන් අරමුණු කරන අවස්ථාවේදී ප්‍රඥාව ප්‍රධාන වෙලා අනිත් ඒවා balance කරගෙන අනිත් ඒවටත් තැනක් දීගෙන යනගතිය තියෙනවා. ඒක නිසා එතැනදී ප්‍රඥාව මුල් වෙනවා අනිත් තැන වලදී හිත මුල් වෙනවා.

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස එතනදී මෝහ මූල සිත් සිත් වශයෙන් ඇත්තටම අධිපති බවක් ගන්නේ නෑ කියන එක තියෙනවා. උදාහරණයක් හැටියට විචිකිච්ඡා සිත ගත්තොත් විචිකිච්ඡා සිතක අධිපති භාවයක් එන්න බෑ කියන එක තේරෙනවා සැක සහිතව යමක් ගැන සිතන හින්ද. වැඩිය ඒක ප්‍රභලව නැගෙන සිතක් වෙන්නේ නැහැයි කියලත් හිතෙනවා. ඒවගේම උද්දච්ච කියන කොටත් සිතෙහි විසුරුනු ගතියක් තිබෙන නිසා සිතේ ප්‍රබල භාවයක් නැති බවත් තේරෙනවා ස්වාමීන්වහන්ස. එතකොට හසිත උත්පාද සිත ගැන කොහොමද සවාමීන්වහන්ස විස්තර වෙන්නේ ඒක යෙදෙන්න නැති වෙන්න හේතුව හැටියට. දැන් අපි දන්නවා ඒකේ වීරිය යෙදෙනවා ඡන්දය යෙදෙන්නේ නැහැ අහේතුක සිතක් නිසා. ඒක හින්දද ස්වාමීන් වහන්ස ඒක ගන්නේ නැත්තේ. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - අනිවාර්යෙන්ම ඔය ඡන්දය කියන එක යෙදෙන්නේ නෑ අහේතුක සිත්වල. ඒක නිසා එතැනදී අධිපති භාවය ගන්නෙත් නෑ. අනිත් එක දැන් ඔය රහතන් වහන්සේලා අපි හිතමු - ඔය හසිත උත්පාද සිත හරි අමුතු සිතක්. අපි ලෞකික වශයෙන් බැලුවහම හිනහ යනවනේ. අපි කවුරුවත්ම හිනහවෙන්නේ මට හිනහවෙන්න ඕනෑ කියල නෙමෙයිනේ. මට හිනහ වෙන්න ඕනෑ කියල හිනහ වෙනවනම් එතකොට හිනහ වීමේ ඕනෑකම තියෙනවා. ඡන්දය තියෙනවා. ඊළඟට හිනහ වෙන්න ඕනෑ කියල උත්සාහයක් කරනවානම් ඒ උත්සාහයේදී වීර්ය තියෙනවා. ඉතින් ඒවගේ තමයි අතනත්. වෙන්නේ ලෞකික හිත්වල හිනහ වෙන අවස්ථාවේදී ප්‍රඥාව වැඩ කරන්නේ නෑ. ලෝභයයි වැඩියෙන් වැඩ කරන්නේ. ප්‍රධාන ලෝභය. ලෝකෝත්තර සිතේදී හසිත උත්පාදයේදී එතනදී වැඩ කරනවා - එතැනදී රහතන්වහන්සේ නමක් හරි බුදුරජාණන්වහන්සේ හරි මෙහෙම 'මම වීර්යෙන් සිනහවෙන්ට ඕනෙයි' කියල උත්සාහයක් කරන්නේ

නැහැ ඡන්දය යොදන්නෙත් නෑ. ආන්න ඒක නිසා එතනදී ඒ හසිත උත්පාද සිත යොදාගන්න් නෑ.

සවාමීන්වහන්ස වීරිය යෙදෙනවා නේද ඒ සිතේ?

<u>පිළිතුර</u> - යෙදුනට මහත්තය ඔය වැඩේ කරන්ට - ඒ කියන්නේ අධිපතිත්වයට ප්‍රධානත්වය දරාගෙන එහෙම එකක් යෙදෙන්නේ නෑ. ඒක නිසා තමයි බැහැර කරලා තියෙන්නේ.

එතකොට ස්වාමීන්වහන්ස අර මෝහ මූල සිත්දෙක ගැන අර විදියට හිතපු එක නිවැරදිද සවාන්මීන්වහන්ස?

එහෙම හරි මහත්තයා ඒ කියන්නේ ඔය මෝහ මූල සිත හරි දූර්වලයිනේ. ඒ කියන්නේ ඒකෙ ඡන්දය හිටින්නේ නෑ ඒ කියන්නේ දැන් කවදාවත්ම යම් කිසි අරමුණක් මට නොතේරෙනවා නම් වැටහෙන්නේ නැත්නම් 'නොතේරේවා' 'නොතේරේවා' කියල කැමැත්තෙන් ඡන්දය දාගෙන ඕකේ නොතේරෙන සවභාවය තියෙන්නේ නැනේ. ඒවගේම තමයි අරමුණේ හිටින්නේ නැනේ - කඩා වැටෙනවනේ. ඒවගේම විචිකිච්ඡාව කියන එක ඇවිල්ල විචිකිච්ඡාව තියෙන හින්දාවෙන්ම හතරමං හන්දිය වගේනේ හතර වටේ කැරකෙන්නා වගේ. ආන්න ඒක නිසා ඒ දූර්වල ස්වභාවය තිබෙන නිසා ඒවා අනිවාර්යෙන්ම - අපි හිතමු ඡන්දය තියෙනවයි කියල. ඡන්දය තියෙනවා කියල කාට ප්‍රධානත්වය දරන්නද ඒ අරමුණේ ඉන්නේ නැනේ මේ සිත. ආරම්මණයේ රැදෙන්නේ නැනේ. හිත ගැලවිලා වැටෙනවනේ. ඒ කියන්නේ හිතට කිසිම sure එකක් නැනේ අරමුණ පිළිබඳව අල්ලගෙන ඉන්ට. ආන්න ඒක නිසා තමයි - කාට ප්‍රධානත්වය දරන්නද? එකයි ඒ මෝහ සිත් ඉවත් වෙන්නේ.

එහෙමයි ස්වාමීන්වහන්ස බොහොම පිං. ඇත්තටම ඒ මෝහ මූල සිත් දෙකයි හසිත උත්පාද සිතයි ජවන් සිත් 55 න් ඒ ජවන් සිත් අයින් උනහම ඉතුරු සිත් තමයි විටින් විට අධිපති භාවයෙන් ඒ ඒ වෙලාවට වැඩ කරනව කියල තේරෙන්නේ ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි සවාමීන්වහන්ස දැන් ප්‍රත්‍යය ධර්ම 4 ක් කිව්ව ඡන්ද චිත්ත විරිය විමංසා කියල. එතකොට ස්වාමීන්වහන්ස අකුසල සිත් වල විශේෂයෙන් ඔබවහන්සේ ගත්තේ ලෝභ මූල සිතේ දැන් එතකොට ප්‍රඥාව (විමංසාව) නැනේ සවාමීන් වහන්ස. එතකොට සවාමීන්වහන්ස කිව්වා ඔය

හතරෙන් එකක් ක්‍රියාත්මක වෙනවා ඉතිරි ඒවා අනුයාත වෙනවා කියල. එතකොට සවාමීන්වහන්ස ප්‍රඥාව කොහොමද ලෝභ මූල සිතට අනුයාත වෙනවා කියන එක ටිකක් පැහැදිලි කරල දෙන්න සවාමීන්වහන්ස. බොහොම පිං සවාමීන් වහන්ස.

<u>පිළිතුර</u> - මෙහෙම එකක් කියන්ට ඕනෑ. ඔය ලෝකෝත්තර හිත් පැත්තට යන්නේ නැතුව - ලෞකික සිත් - ඔය තියෙන කාමාවචර ලෝභ මූල සිත් - කුසල් සිත් එහෙම ඒවා වැඩ කිරීමේදී කවදාවත්ම මේ හතරම එකට යෙදෙන්නේ නෑ. ලෝභ මූල සිත්වල ඡන්ද චිත්ත විරිය විමංසා කියල ඒ ධර්‍මතා 4 ක් අධිපති ධර්‍ම හැටියට සාමූහික වශයෙන් අරගෙන කථා කරාට ඒකෙන් කියන්නේ නෑ මේ හතර දෙනාම කුසල් වලත් ඉන්නවාය අකුසල් වලත් ඉන්නවාය කියල. දැන් මේක මේ අපේ පිංවත් මහත්මිය අහපු ප්‍රශ්නයට අනුකූලව අපි බෙදල ගත්තොත් එහෙම ධර්‍මතා තියෙනවනේ 4 ක්. ඡන්දයයි වීර්යයි දෙක සමහර අවස්ථාවලදී කුසල් සිත් වලත් ප්‍රධාන වෙන්න පුළුවන් ඊළගට අකුසල් සිත්වලත් ප්‍රධාන වෙන්ට පුළුවන්. ඡන්දයයි වීර්යයි දෙක. හැබැයි ප්‍රඥාව කියන එක ප්‍රධාන වෙනවනම් අධිපතිත්වය දරනවා කුසල් සිත් වල විතරමයි. හේතුව විමංසා අධිපති කුසලයක් නිසා. ඊළහට චිත්තය ගත්තයින් පස්සේ ඒකෙත් කුසල් සිතුත් තියෙනවා අකුසල් සිතුත් තියෙනවනේ. ඒක කුසල් හරි අකුසල් හරි දෙපැත්තට ගන්න පුළුවන්. ඒක නිසා මේක අපි විස්තර කරන කොට ඒ සිත් ඔක්කෝම සාමූහිකව අරගෙන - ඒකෙන් කියන්නේ නෑ ඒ හතර දෙනාම එක සිතක ඉන්නවයි කියල. ඒ විදිටය තේරුම් ගත්තහම ප්‍රශ්නය නිරාකරණය වෙනවා.

පැහැදිලි උනා ස්වාමීන්වහන්ස බොහොම පිං.

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගත්තොත් හොඳයි කියල හිතුන. ඔබ වහන්සේ කථාකරපු සහජාත අධිපති ධර්‍ම ඡන්ද විරිය චිත්ත විමංසා බෝධිපාක්ෂික ධර්‍මවල තිබෙන ධර්‍ම - 'ඡන්ද විරිය චිත්ත විමංසා' - සතර ඉද්ධි පාද වශයෙන් තේරුම් ගත්තොත් හරිද කියල දැන ගන්න කැමතියි. ඒවගේම බෝධිපාක්ෂික ධර්‍මවල විමංසා ඉද්ධිපාදයට අමතරව පංච ඉන්ද්‍රිය - පංච බල කියල ප්‍රඥාව තියෙන බව දැනගෙන තියෙනවා. එතකොට ඔබ වහන්සේ සඳහන් කළා ප්‍රඥාව මුල්වන බව නිර්වාණයට. එතකොට ඒ තුනම එක විට ප්‍රමුඛ වනවාද කියලත් දැනගන්න කැමතියි. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඡන්දය කියන චෛතසිකය - විරිය - විමංසා කියන චෛතසිකය ඊළඟට සිත් යන මේවා අර බෝධිපාක්ෂික ධර්‍ම වල කථාකරන්නාවූ හතරම තමයි.

හැබැයි මෙතැන කථා කරන්නේ බෝධිපාක්ෂික ධර්ම නම් වශයෙන් නෙමෙයි. මෙතැන් කථා කරන්නේ ඒ හතර දෙනාගේ තිබෙන විශේෂිත බලපෑම් හැකියාවක් අවුස්සාගෙනයි. එතකොට එකේ තියෙන - අනිත් ධර්ම වලට කොහොමද leadership එක දෙන්නේ - එහෙම නැත්නම් අනිත් ඒවා තමන්ගේ පැත්තට හරවාගෙන පවත්වා ගන්නේ කොහොමද කියන කථාව විතරයි. ඒක තමයි ප්‍රත්‍යය ධර්ම හොයනවා කියල කියන්නේ. ඒ මාතෘකාව යටතේ තමයි ඔය කථා කරන්නේ. ඊළඟට අර කිච්චනේ ඉන්ද්‍රිය ධර්ම බල ධර්ම ඒවත් අර මාර්ග සිත්වල වැඩ කරනවා. තව එකක් අපි බෝධිපාක්ෂික ධර්ම පොඩ්ඩක් අරන් කථාකරොත් අපේ පෘතක්ජන හිතක බෝධිපාක්ෂික ධර්ම වඩන කොට සෝවාන් සකෘදාගාමී අනාගාමී අරහත් කියන මාර්ග සිත් අවස්ථාවේ නැතිව - භාවනා එහෙම කරන කොට ඔය බෝධිපාක්ෂික ධර්ම වැඩෙන්නේ තනි තනියෙන්. ඒ කියන්නේ දෙන්නෙක් ඉන්නවා - තුන්දෙනෙක් නෑ. වීර්ය තියෙනවා ප්‍රඥාව නෑ - සමහර වෙලාවට ප්‍රඥාව තියෙනවා. සමහර ඒවා අඩුවෙන් තියෙනවා - සමහර ඒවා ක්‍රියාත්මක වෙනවා. ඉතින් එහෙම තමයි පෘතක්ජන හිත්වල සහ මාර්ග අවස්ථාවකින් තොර වෙච්ච හිත්වල ඔය බෝධිපාක්ෂික ධර්ම වල ක්‍රියාකාරී ස්වභාවය. හැබැයි බෝධිපාක්ෂික ධර්ම මාර්ග සිතේ වැඩෙන කොට ඔය ඔක්කොම පේළියට ශක්තිමත්ව එක සමාන වෙනවා. අන්න ඒක නිසා තමයි මේකට නිවන අහුවෙන්නේ. ඉතින් ඔය ඉන්ද්‍රිය ධර්ම ගැන කථා කරන කොටත් වෙන නමකින් තමයි කථා කරන්නේ - විමංසා ව කියන එක මෙතැනදී අධිපති ධර්මයක් හැටියට කථාකරනව අතෙන්ට ගියාට පස්සේ ඒක ඉන්ද්‍රියක් හැටියට - බලයක් හැටියට කථා කරනවා. ඉතින් එහෙම තියෙනවා. අර ඉද්ධි පාද ධර්මවල කථාකරන හතර දෙනා තමයි මෙතනදී මේ විදියට අපි අධිපති ධර්ම හැටියට කථාකරන්නේ. ඕක ලෝකයේ සාමාන්‍ය සවභාවයක්. පැණිරස කියන ජාතිය ද්‍රව්‍යාත්මකව බැලුවට පස්සේ ඒවා වෙන වෙන නම් වලින් කියවෙනවා. 'පැණි' දියරක් වශයෙන් ආවට පස්සේ පැණි කියල කියනවා. ඊළඟට ඒවා දියර කරන්නේ නැතුව කැට වශයෙන් ආවට පස්සේ සීනි කියල කියනවා. සමහර වෙලාවට ඒකම ගල් කැල්ලක් වශයෙන් තිබුනොත් එහෙම හකුරු කියන නමින් කියනවා. ඊළඟට සීනි වැඩිපුරම යම්කිසි කෑමකට දාල හැදුවයින් පස්සේ කැවුම් කියනවා - පැණි කැවුම් කියනවා ඒවගේනේ. ඒවගේ ඔය එකම ධර්මයනේ. වෙන වෙන නම් වලින් හැඩ ගස්ස ගස්ස අවස්ථාවට ගැලපෙන පරිදි රඟ දක්වන ආහාර කොටසක්නේ.

ඒ වගේ තමයි එකම ධර්මය කරන ක්‍රියාවේ හැටියට වෙනස්කරල නම්කරල ගන්නවා. ආන්න එහෙම ස්වභාවයක් තමයි ප්‍රත්‍යය ධර්ම කථාවේ තියෙන්නේ.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම කථාවේ තියෙන්නේ. මම හිතනවා මේක තේරෙන්න ඇති කියල. තෙරුවන් සරණයි!

තේරුණා බොහොම පිං ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>වසන්ත මහත්මයා</u> - තෙරුවන් සරණයි සියලු දෙනාටම. අවසරයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අද අපිට සෑහෙන ගැඹුරු ධර්ම කාණ්ඩයක් ඉතාම සරලව පැහැදිලි කරලා දුන්න. අපි ඒක ඉතාමත්ම ඕනෑකමින් අහගෙන හිටිය. මම එකේ සටහන් ලියාගෙන තව ඉදිරියටත් දහම් කරුණු රාශියක් මේ සූවිසි ප්‍රත්‍යය ගැන දැන ගන්න අපිට තියෙනවා. ඉතින් ඔබවහන්සේ ඒ අපිට කියල දුන්න ඒවා හොඳින් මතක තියාගෙන කොහොමද මේක ප්‍රයෝගිකව යොදා ගන්නේ කියන එකත් කරන්න තමයි උත්සාහ කරන්නේ. මේ කාරණාව මතක තියාගෙන අද දවසේ මේ සාකච්ඡාව අපිට කරන්න උපකාර කරන අපේ දළුවත්ත මහත්මයාටත් සංවිධානය කරන මත්මයාටත් නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින් සවාමීන්වහන්සේට ආරාධනා කරනවා අපේ මේ ධර්ම සාකච්ඡාව අවසන් කරන්න කියල. තෙරුවන් සරණයි!

<u>සවාමීන් වහන්සේ</u> -හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි. මේ වෙලාවේදී අපේ ලලිත් දළුවත්ත මහත්මයා මුල්වෙලා මේ කරන්නාවූ ධර්ම සාකච්ඡා මණ්ඩපයේ තවත් අවස්ථාවක් උදාපත් උනා. අදත් අපි එක්තරා ධර්ම කොටසක් විතරයි ඉදිරිපත් කර ගත්තේ. අපි නැවත මේ මාතෘකාව යටතේ අවස්ථාවක් අරගෙන කථා කරමු. අදත් ධර්ම සාකච්ඡාවට ඉදිරිපත් වෙලා බොහොම ශ්‍රද්ධාවෙන් බුදුරජාණන්වහන්සේගේ ධර්මය හොයන්ට ඕන - මෙනෙහි කරන්ට ඕන - දැනගන්ට ඕනෑ කියන හිතෙන් ඉදිරිපත්වෙලා මේ ධර්මය ඇසීමෙන් උපදවාගත්ත සියලුම කුසල් බලයෙන් සහ තුනුරුවන් සතු අනන්ත අපරිමාණ ගුණානුභාව බලයෙන් පිංවත් ලලිත් දළුවත්ත මහතාට නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! කියල අපි සියලු දෙනාම මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරමු. ඉතින් මේ පිංවත් මහත්මයා කරගෙන යන්නාවූ සියලු දැහැමි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථකවේවා! විශේෂයෙන්ම අතීත අකුසල කර්ම බලවේග යටපත් වෙලා කුසලකර්ම බලවේග ශක්තිය මතුවෙලා අදිෂ්ඨානයෙන් යුක්තව ධර්මය පිළිපදිමින් ධර්මය අවබෝධය කර ගැනීමට උපකාර වන පාරමී ධර්ම ශක්තිය දියුණු කරගන්ට ලැබේවා! මහත්මයාටත් පවුලේ සැමදෙනාටමත් අද මේ පිංවත් - ප්‍රශ්න ඇසූ - අහගෙන සිටියාවූ ලෝක වාසි පිංවත් සැම දෙනාටම මේ කුසල් බලයෙන් සහ ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් මේ උතුම් ධර්මය හොයා හොයා සියුම් ආකාරයෙන් තිබෙන්නාවූ ධර්ම වල තිබෙන ගතිය ඉතාමත් හොඳින්

තේරුම් අරගෙන - වටහාගෙන එවාගේ තිබෙන ක්‍රියාකාරී සවභාවය මිසක ඒවාට ආත්මීය ස්වභාවයක් නෑ කියන කාරණය තේරුම් අරගෙන ඒවායේ රඳා නො පවතින අනිත්‍ය ස්වභාවය තේරුම් අරගෙන ඒවගේම දුක්ඛ ස්වභාවය තේරුම් අරගෙන එයින් මිදිලා නිවනින් සැනසෙන්ට ලැබේවා! නිර්වාණ ධාතුව අවබෝධ කරගන්ට මේ ධර්ම සාකච්ඡාවෙන් ලද පින සැමදෙනාටම හේතු වාසනා වේවා කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. හැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං